# සිංහල බ්ලොග්කරණය

## භාෂාව

මානව සන්නිවේදනයේ ඉතිහාසය වසර සිය දහස් ගණනක් ඈතට ඇදී යයි. මානවයා සිය මූලික අවශ්‍යතා සහ සිතුම් පැතුම් එකිනෙකා හා හුවමාරු කරගැනීමේ ක්‍රියාවලිය සන්නිවේදනය නම් වේ. ආරම්භයේදී විවිධ විවිධ ඉඟි බිඟි ඉරියව් ශබ්ද ඒ සඳහා යොදා ගැනිණි. අනතුරුව මානව පරිණාමය මහත් විප්ලවයකට බඳුන් කළ සොයාගැනීම සිදු විය. ඒ සන්නිවේදනය සඳහා මිනිසා එදා මෙදාතුර නිපදවාගත් වටිනාම මෙවලම වන භාෂාව නිපදවා ගැනීම ය. කුඩා ඇල්පෙනෙත්තේ සිට අහහරු මත ගොඩ බට යාන දක්වා සියලු විස්මකර්ම නිපයුම්වල පදනම එකී සොයාගැනීම ය. මෙලෙස නිපදවාගත් භාෂා සිය දහස් ගණනක් ලොව පුරා බැවහර වෙයි. සංඛ්‍යාත්මක වශයෙන් භාෂා 6700ක් පමණ වේ. සිංහලයෝ සිංහලෙන් කථා කරති. වෙනත් ජාතීහු ඔවුනොවුන්ගේ භාෂා වහරති.

## ලේඛන මාධ්‍ය සහ අන්තර්ජාලය

මූලික වශයෙන් භාෂාව, භාෂණය හා ලේඛනය ලෙස දෙවැදෑරුම් වේ. වත්මන් මිනිසා අද වහරන්නේ අතීතයේ සිට ක්‍රමයෙන් විකාසනය වූ භාෂාවෙකි. විශේෂයෙන් ලිඛිත භාෂාව සලකන කල එහි මාධ්‍යය ද යුගයෙන් යුගයට විපරිණාමය විය. ඒ ගල් පුවරුව, ලෝහ පෘෂ්ඨය, පුස්කොළය හා කඩදාසිය ආදී වශයෙනි. මේ විකාසනයේ වඩාත් සංවර්ධිත ලේඛන මාධ්‍යය ලෙස අන්තර්ජාලය හැඳින්වීම නිවැරදි ය.

සන්නිවේදනය ආරම්භයේ දී මිනිසා ඒ සඳහා විවිධ ප්‍රාථමික ක්‍රමවේද භාවිත කළේ ය. මුලදී දෙදෙනකු හෝ කිහිප දෙනෙකු මුහුණට මුහුණලා කළ සන්නිවේදනය පසුව ඔවුනොවුන් භූගෝලීය වශයෙන් දෙතැනක සිටින විට ද කළ හැකි ලෙස තත්ත්වයට වර්ධනය විය. කාලයත් සමඟ ඒ ක්‍රම ද විකාසනය විය. දුමක් නැංවීම, බෙර වාදනය, කුරුලු දූතයින්, අණබෙරය, ආඥා, පුවත්පත්, ගුවන් විදිලිය හා රූපවාහිනිය ආදී නිදසුන් මගින් එකී විකාසනය හඳුනාගත හැකි ය. එකී විකාසනයේ ද සංවර්ධිත අවස්ථාව ලෙස අන්තර්ජාලය හැඳින්විය හැකි ය.

21 වන සියවසේදී ලෝකය විශ්ව ගම්මානයක් වීයයි පැවසේ. එහි අරුත ලොව පුරා සිටින මිනිසුන් අතර එතෙක් පැවති දූරස්ථභාවය අහෝසි වී සමීපස්ථ සබැඳියාවක් බිහි වූ බව ය. එය සිදු වූයේ කෙසේ ද? භූගෝලීය වශයෙන් ලොව කුඩා විණි ද? නැත. එකී සංසිද්ධියට පදනම් පදනම් වූයේ ද සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව ය. සන්නිවේදන දියුණුව මිනිසා එකිනෙකාට වඩා වඩාත් සමීප කළේ ය. මෙහිලා අන්තර්ජාලය කළ මෙහෙය සුළුපටු නැත.

**අන්තර්ජාලය සහ වෙබ්**

අන්තර්ජාලයේ මුල් අවධිය වෙබ් 1.0 ලෙස හැදින්වේ. එකල තොරතුරු ගලා ගියේ එක් දිශාවකට පමණි. එම තොරතුරුවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාවක් පාඨකයාට නොතිබිණි. එනම් ලේඛක පාඨක දෙපිරිස අතර සංවාදයට මගක් නොතිබිණි. සාමාන්‍ය වෙබ් අඩවි මේ සඳහා නිදසුන් ය. අනතුරුව උදාවූයේ වෙබ් 2.0 යුගයයි. එහිදි දෙපිරිස අතර සංවාදයට අවස්ථාව ලැබිණි. ජාලයේ ලියන බ්ලොග් සටහන්" blog (Web blog) නමැති සංකල්පය ද මේ යුගයට අයත් ය.

**බ්ලොග් අඩවියක් යනු කුමක් ද?**

බ්ලොග් අඩවියක් යනු වෙබ් අඩවියෙකි. එහෙත් එය සැකැස්මෙන්, අන්තර්ගතයෙන්, අරමුණින් සාමාන්‍ය වෙබ් අඩවියකින් වෙනස් වෙයි. එමෙන් ම බ්ලොග් අඩවියක් දිනපොතක් ලෙස ද නිර්වචනය කෙරෙයි. එහෙත් එය සාමාන්‍ය දින පොතක් මෙන් තමන්ට සීමා වූවක් නොවේ. ලොව පුරා සිටින අන්තර්ජාල සැරිසරන්නන්ට පරිශීලනය කළ හැකි ප්‍රපංචයකි. එපමණක් නොව ඊට ලිය කියවිලිවලට අමතරව ඡායාරූප, ශව්‍ය දෘශ්‍ය තැටි (ඕඩියෝ හා වීඩියෝ) වැනි දෑ ද ඇතුළත් කල හැකි ය. මේ සියලු කරුණු සලකා බලන කල, බොහෝ විට නිතර යාවත්කාලීන කෙරෙන ප්‍රකාශන කාලානුක්‍රමික ලෙස පළ කෙරන පුද්ගල සිතිවිලි එකතුවක් සහිත වෙබ් අඩවිය බ්ලොග් අඩවියකැයි සරලව පැවසිය හැකි ය. සාමාන්‍යයෙන් තනි තනිව නඩත්තු කෙරෙන, ක්‍රමවත් විස්තර වර්ණනා, සිදුවීම් පිළිබඳ අර්ථකථන හෝ ග්‍රාපික නැතහොත් වීඩියෝ එකතුවක් සහිත වෙබ් අඩවියක් බ්ලොග් අඩවියකැයි වඩාත් පැහැදිළිව නිර්වචනය කළ හැකි ය.

**බ්ලොග් සංකල්පයේ ඉතිහාසය**

බ්ලොග් ජනප්‍රිය වීමට පෙර ද ඒ සඳහා නොයෙක් විකල්ප භාවිත විය. Usenet මෙන් ම Genie වැනි ව්‍යාපාරික සබැඳි සේවා ඊට නිදසුන් ය. අනතුරුව විවිධ සන්ධිස්ථාන පසු කරමින් මෙම සංකල්පය වේගයෙන් දියුණු විය. 1994 දී ප්‍රජා පෝරමයක් (acommunity formed) ලෙස මාර්ගගත දිනපොත් (Online diaries) බිහි විය. මෙම දිනපොත් මුළුමනින් ම සබැඳි සඟරා (online journals)විය. මිනිසා තම දෛනික ගිනුම් කටයුතු, අත්දැකීම් මෙන් ම සමාජ විවරණ, දුක්ගැනවිලි, ගද්‍ය, පද්‍ය, අයුතු සිතිවිලි ආදී සාම්ප්‍රදායික දිනපොතක හෝ සඟරාවක දැකිය හැකි සියලුම දෑ එහි සටහන් කළේ ය. බොහෝ විට පාඨකයින්ට සිය අදහස් පළ කිරීමට ද ඉඩ ලබා දෙන ලදි. අද අප බ්ලොග් ලෙස හඳුන්වන්නේ එම සංකල්පයේ විකාශනයකි. ආරම්භයේදී 'වෙබ් බ්ලොග්' (weblog) නමැති යෙදුම යෙදිණි. එය මුල් වරට භාවිත කළේ ජෝන් බාගර් (Jorn Barger) විසින් 1997 දී ය. පීටර් මර්හොල්ස් (Peter Merholz) 'බ්ලොග්' යන කෙටි යෙදුම නිර්මාණය කළේ ය. නොබෝ කලකින් ලොව පුරා අන්තර්ජාල භාවිත කරන්නන් අතර බ්ලොග් වේගයෙන් ජනප්‍රිය විය.

## නූතන බ්ලොග් ප්‍රජාව

සන්නිවේදන මෙවලමක් ලෙස බ්ලොග් සංකල්පය ලොව පුරා වේගයෙන් ජනප්‍රිය විය. එය හඳුන්වනු ලබන්නේ පුරවැසි මාධ්‍යවේදය යන නැවුම් වදන්වලිනි. එම ජනප්‍රියතාව කෙතරම් ද යත් ලොව පුරා සිදුවන විවිධ සංසිද්ධි පිළිබඳ මහජන මතය විමසා බැලෙන ප්‍රධාන නිර්ණායකයක් බවට බ්ලොග් අඩවි පත්ව ඇත. එමෙන් ම බ්ලොග් අඩවිවල ලියැවෙන නවකතා සඳහා පිරිනැමෙන blooker (http://lulublookerprize.typepad.com/) සම්මානය සහ විවිධාකාර බ්ලොග් සම්මාන උත්සව ද පසක් කරන්නේ වර්තමානය වන විට බ්ලොග් අඩවි කෙතරම් ජනප්‍රිය සන්නිවේදන මෙවලමක් බවට පත්වී ඇද්ද යන්න ය.

මේ වන විට සිංහල බ්ලොග් බොහෝ ගණනක් ලියැවෙන අතර දෛනිකව ඒ පිරිසට තව තවත් පිරිස් ඒකරාශි වීම දැකිය හැකි ය. එමෙන් ම ලොව සිංහල බ්ලොග් කියවන පාඨක පිරිස ද දිනෙන් දින වැඩිවෙමින් පවතී.

## බ්ලොග්වල විශේෂතා

බ්ලොග් සංකල්පය 20 වන සියවසේ අග දශකයේ බිහිව ව්‍යාප්ත වූවක් බව අපි පෙර ද සාකච්ඡා කළෙමු. එහෙත් ඊට බොහෝ කලකට පෙර සිට මිනිසා සන්නිවේදන කටයුතු සඳහා විවිධ සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගත්තේ ය. පොත්, පුවත්පත්, සඟරා, ගුවන්විදුලිය, රූපවාහිනිය සහ සාමාන්‍ය වෙබ් අඩවි ඒ සඳහා නිදසුන් කිහිපයකි. එකී සන්නිවේදන මාධ්‍ය සහ නූතන බ්ලොග් අතර වෙනසක් තිබේ ද? ඒ කවරකාර වෙනසක් ද? සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය හා සැසඳීමේදී නූතන බ්ලොග්වල දක්නට ලැබෙන ප්‍රවණතාත්මක ලක්ෂණ නැතහොත් වෙනස්කම් කිහිපයක් මෙසේ ය. එම කරුණු සැලකීමේදී බ්ලොග්කරණය සන්නිවේදන මාධ්‍යය විෂයෙහි විප්ලවීය ප්‍රවේශයක් වූ බව පැහැදිළි ය.

- බොහෝ වාරණ සීමාවලින් මිදී කටයුතු කිරීමේ හැකියාව
- අඩවිය පවත්වාගෙන යාමට කාර්මික දැනුම අත්‍යවශ්‍ය නොවීම
- පාඨක ප්‍රතිචාර එකතු කළ හැකිවීම
- පාඨක ලේඛක දෙපාර්ශවය අතර සංවාදයක් ගොඩ නැඟීමේ හැකියාව
- නව ලිපි පළ වූ වහා පාඨකයින්ට දැනගත හැකිවීම (rss feed මගින්)
- පාඨක අදහස් පාලනයේ හැකියාව
- ප්‍රකාශන කාලානුක්‍රමික ලෙස පළවීම
- ප්‍රකාශන නැවත නැවත සංස්කරණය කිරීමේ හැකියාව
- අන්වර්ථ නාමයකින් වුව පවත්වා ගෙන යාහැකි වීම
- පුද්ගලිකව හෝ සාමූහිකව පවත්වාගෙන යාහැකි වීම
- ප්‍රකාශිත හෝ අප්‍රකාශිත අඩවියක් ලෙස පවත්වාගෙන යාහැකි වීම

## බ්ලොග් අඩවි වර්ග

ප්‍රජාව අතර බ්ලොග් ජනප්‍රිය වත් ම ඒ අතර විවිධත්වයක් ඇති විය. එම විවිධත්වය බ්ලොග් අන්තර්ගතයේ පමණක් නොව අන්තර්ජාලයට මුදා හරින ආකාරයේ ද ලේඛන ශෛලියේ ද තිබිණි. එම වෙනස්කම් පදනම් කරගෙන බ්ලොග් වර්ගීකරණය කළ හැකි ය.

- **පෞද්ගිලක බ්ලොග් අඩවි**

ලොව පුරා වඩාත් ජනප්‍රිය, දිනපොතක් හෝ විවරණයක් ලෙස තනි තනිව ලියන සාම්ප්‍රදායික බ්ලොග් විශේෂයයි. ඇතැම් බ්ලොග් ප්‍රධාන දහරාවේ ප්‍රසිද්ධ වෙයි. තවත් බ්ලොග්වලට ඉක්මණින් පාඨක සමාජයක් ගොඩනැඟෙයි. පෞද්ගලික බ්ලොග් නැවත ප්‍රභේද කළ හැකි අතර ඒවා microblogging ලෙස හැඳින්වේ. සිංහලෙන් ලියැවෙන බොහෝ බ්ලොග් පෞද්ගලික අඩවි වේ.

- **සාමූහික බ්ලොග් අඩවි**

බොහෝ අවස්ථාවල බ්ලොග් අඩවි පෞද්ගලිකව පවත්වා ගෙන යන අතර ඇතැම් විට ව්‍යාපාරික අරමුණුවලින් ද  බ්ලොග්කරණයේ යෙදෙයි. එමෙන් ම බ්ලොග් අභ්‍යන්තරව සමාජයේ සන්නිවේදන සහ සංස්කෘතික ප්‍රවර්ධනය පිණිස හෝ බාහිරව අලෙවිකරණය සහ වෙළඳ නාම ප්‍රවර්ධනය පිණිස භාවිත විය. නැතිනම් මහජන සබඳතා ප්‍රවර්ධනය පිණිස භාවිත විය. එම බ්ලොග් අඩවි පොදුවේ සාමූහික අඩවි (Corporate Blogs) ලෙස හැඳින්වේ. සාමූහික සිංහල අඩවි දැකිය හැක්කේ ඉතා ම දුලබ වශයෙනි.

- **ප්‍රශ්න බ්ලොග් අඩවි**

අපට දක්නට ලැබෙන තවත් බ්ලොග් වර්ගයකි: ප්‍රශ්න සහ පිළිතුරු බ්ලොග්. ප්‍රශ්න යොමු කිරීම් ආකෘති නැතහොත් ඉ තැපැල්, දුරකතන හෝ අන්තර්ජාලය (VOIP) මගින් යොමු කළ හැකි ය.

- **මාධ්‍ය බ්ලොග් අඩවි**

විවිධ සන්නිවේදන ක්‍රම ඇතුලත් බ්ලොග් මාධ්‍ය බ්ලොග් යනුවෙන් හැඳින්වේ. මීඩියා හෙවත් මාධ්‍ය බ්ලොග් ප්‍රභේද කිහිපයකි.  වීඩියෝ අඩංගු බ්ලොග් vlog (Video blogging හෝ vlogging) යනුවෙන් ද වෙබ් අඩවි ලිපින අඩංගු බ්ලොග් linklog යනුවෙන් ද ලුහුඬු සටහන් ලිපි ගොනු අඩංගු බ්ලොග් sketchblog යනුවෙන් ද ඡායාරූප අඩංගු බ්ලොග් photoblog යනුවෙන් ද කෙටි සටහන් සහ මිශ්‍ර ජනමාධ්‍ය අඩංගු බ්ලොග් tumblelogs යනුවෙන් ද හැඳින්වේ. මේ සෑම වර්ගයකම බ්ලොග් සිංහල බසින් ද දැන් දැකිය හැකි ය.

- **උපකරණ බ්ලොග් අඩවි**

ආධුනිකයින් උදෙසා බ්ලොග් එකක් තනන සහ නඩත්තු කරන ක්‍රමවේදය බ්ලොග් එකක් මගින් ම පැහැදිළි කළ හැකි ය. ඇතැම් විට ජංගම දුරකතන වැනි ජංගම උපකරණ මගින් හෝ PDA මගින් බ්ලොග් ලියනු ලැබේ. ඒවා moblog යයි හැඳින්වේ. උපකරණ බ්ලොග් මෙරට දුලබ ය.

- **විෂය මූල බ්ලොග් අඩවි**

ඇතැම් බ්ලොග්, විශේෂ විෂය ක්ෂේත්‍ර ඉලක්ක කරගෙන ලියනු ලැබේ. දේශපාලන, සංචාරක, නිවාස, විලාසිතා, ව්‍යාපෘති, අධ්‍යාපන, නිකේතන, නීති, සම්භාව්‍ය සංගීත බ්ලොග් අඩවි ඒ සඳහා නිදසුන් වේ. අතැම් විට එක ම අඩවියේ විවිධ විෂය ක්ෂේත්‍ර ගැන ලියැවෙන හෙයින් ඒවා මෙවැනි එක් කොටසකට වෙන් නොකළ හැකි ය. එවැනි අඩවි Splog යනුවෙන් හැඳින්වේ. සිංහල බසින් ලියැවෙන බ්ලොග් බහුතරය මේ ගණයට අයිති බව පැවසීම නිවැරදි ය.

තොරතුරු : - http://en.wikipedia.org/wiki/Blogging#Types

**බ්ලොග් ආචාර ධර්ම**

- **අවංක සහ සාධාරණ වන්න**

බ්ලොග්කරුවන් තොරතුරු එකතු කිරීමේදී අර්ථකථනයේදී සහ වාර්ථාකරණයේදී අවංක සහ සාධාරණ විය යුතු ය. අනුන්ගේ රචනා සාවද්‍ය ලෙස සිය නමින් පළ නොකළ යුතු ය. හැකි සෑම විට ම මූලාශ්‍ර තොරතුරු දක්වන්න. විස්තර, ඡායාරූප, මාතෘකා, ප්‍රශ්න හෝ වෙනත් අන්තර්ගත වරදවා විස්තර නොකරන්න. වැරදි තොරතුරු පළ කිරීමෙන් වළකින්න. සංස්කරණය කළ ඡායාරූප ඒ පිළිබඳ සඳහන් නොකර පළ නොකරන්න.

- **අවිහිංසාවාදී වන්න**

විනයගරුක බ්ලොග්කරුවන් මූලාශ්‍ර කරගත යුත්තේ මානව සංහතියේ අර්ථ සිද්ධිය ගරු කරන දෑය. බ්ලොග් අන්තර්ගතයට විරුද්ධ අදහස් දරන්නන්ට කාරුණික වන්න. අදාළ විෂය ගැන ආධුනිකයින් සහ ළමයින් සමඟ ගනුදෙනු කිරීමේදී විශේෂයෙන් සංවේදී වන්න. ශෝකජනක හෝ කනගාටුදායක සම්මුඛ සාකච්ඡා, ඡායාරූප භාවිතයේදී සංවේදී වන්න. තොරතුරු රැස්කරන විට සහ වාර්තාකරන විට හිංසාව අපහසුව ඇති කළ දෑ හඳුනාගන්න. තොරතුරු පරිශීලනය කිරීම ගර්වයට කාරණයක් නොවන බව වටහා ගන්න.

- **වගකීමෙන් යුතුවන්න**

බ්ලොග්කරුවන් සිය අත්වැරදි පිළිගෙන වහා නිවැරදි විය යුතු ය. එක් එක් බ්ලොග්කරුවන් සිය මෙහෙවර පැහැදිළි කරමින් සිය බ්ලොග් අන්තර්ගතය ගැන සංවාදයට පාඨකයින්ට ආරාධනා කරන්න. ප්‍රතිවිරුද්ධ අභිරුචි, සම්බන්ධ කිරීම්, ක්‍රියාකාරකම් සහ පෞද්ගලික න්‍යාය පත්‍ර අනාවරණය කරන්න.
වෙනත් බ්ලොග්කරුවන්ගේ සමාජ විරෝධී ක්‍රියාකාරකම් අනාවරණය කරන්න. කවර අය කවර දේ කීවත් සිය ස්ථාවරයේ නොසැලී කටයුතු කිරීමට වගබලා ගන්න.

තොරතුරු:- http://www.cyberjournalist.net/news/000215.php

**බ්ලොග් ප්‍රජාව සහ නාමාවලි**

ක්‍රමයෙන් බ්ලොග් අඩවි ව්‍යාප්ත වත් ම බ්ලොග් ප්‍රජා එකතු බිහි විය. එවන් බ්ලොග් අඩවි නම් එකතුවක් බ්ලොග් නාමාවලියක් ලෙස හැඳින්වේ. *Blogosphere* හෙවත් බ්ලොග් නාමාවලීන්හි සියලු බ්ලොග් අඩවි සහ ඒවායේ අතුරු සබැඳුම් දැකිය හැකි ය.

බ්ලොග් අඩවියක් අන්තර්ජාලයට මුදාහැරී අවස්ථාවේ සිට එය අන්තර් සබඳතා ඇති කරන්නක් සහ සමාජ ජාලයක් ලෙස ක්‍රියාත්මක වේ. විවිධ ප්‍රශ්න ගැන බ්ලොග් එකතුවල සිදුකෙරෙන සාකච්ඡා අදාළ ප්‍රශ්න ගැන මහජන අදහස් පිළිබිඹු කරන මිනුම් දණ්ඩක් ලෙස ද මාධ්‍ය විසින් භාවිත කෙරෙයි. බ්ලොග් නාමාවලියක් ඇතැම් විට බ්ලොග් නාම යළි සිහිපත් කරවන්නක් ලෙස ද ක්‍රියාකරයි. ලොව පුරා ලියැවෙන බ්ලොග් අන්තර්ගත දෛනිකව පළකෙරෙන බ්ලොග් නාමාවලියක් ලෙස Global voice (http://globalvoicesonline.org/) හැඳින්විය හැකි ය. wordpress.com (http://wordpress.com/tag/sri-lankan-blogosphere/) ද මෙවැනි බ්ලොග් නාමාවලියකට නිදසුනකි. එමෙන් ම කොත්තු (http://www.kottu.org/) යනු ශ්‍රී ලාංකික බ්ලොග් නාමාවලියෙකි. සිංහල බ්ලොග් කියවනය (http://blogs.sinhalabloggers.com/) සිංහල බ්ලොග් ප්‍රජාව අතර ජනප්‍රිය වූ සිංහල අඩවි සඳහා වෙන් වූවකි.

**බ්ලොග් සෙවුම් යන්ත්‍ර**

අන්තර්ජාලයේ බ්ලොග් සෙවීම සඳහා බ්ලොග් සෙවුම් යන්ත්‍ර භාවිත කෙරෙයි. Bloglines, BlogScope සහ Technorati ලොව පුරා ජනප්‍රිය එවන් සෙවුම් යන්ත්‍ර කිහිපයකි. සිංහල බ්ලොග් සෙවුම් යන්ත්‍රය (http://www.google.com/coop/cse?cx=002129709883619435437:9xufl9v_mfo) සිංහල බ්ලොග් සෙවීම සඳහා භාවිත කරන එවන් සෙවුම් යන්ත්‍රයකි. නූතන පර්යේෂණ ප්‍රජාව යතුරු පද භාවිතයෙන් කෙරෙන සරළ ගවේෂණ ක්‍රමවේදය අතික්‍රමණය කොට වඩා පුළුල් තොරතුරු ප්‍රමාණයක් වෙත පිවිසිය හැකි නව මංපෙත් වෙත යමින් සිටිති.

## බ්ලොග් සහ වෙළඳ ප්‍රචාරය

බ්ලොග්කරුවන් ප්‍රියකරන දේ ප්‍රචලිත කිරීමට හෝ මූල්‍යමය ප්‍රතිලාභ ලැබීමට හෝ දැන්වීම් පළකිරීම බ්ලොග්වල දක්නට ලැබෙන විශේෂාංගයෙකි. බ්ලොග්වල ජනප්‍රියතාව විවිධ ආයතන සිය නිපැයුම් සහ සේවා අලෙවි ප්‍රවර්ධනය සඳහා බ්ලොග් භාවිතයට හේතු වනු ඇත. ඒවා flack blog හෙවත් fake blog හෙවත් flog යනුවෙන් හැඳින්වේ. කෙසේ වුව ද මූල්‍යමය ප්‍රතිලාභ ලැබීම සඳහා වෙළඳ දැන්වීම පළකිරීමට තරම් සිංහල බ්ලොග් තවමත් සමාජගත වී නොමැත. එහෙත් නුදුරු අනාගතයේදීම සිංහල බ්ලොග් එම තත්ත්වයට ළඟා වනු ඇතැයි අපට අනුමාන කළ හැකි ය.